# මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477669 +94 11 2346304
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

| | |
|---|---|
| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| දිනය | 2023.10.31 |


## ඉදිකිරීම් කටයුතු සඳහා වන ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය- සැප්තැම්බර් 2023

**ඉදිකිරීම් ක්‍රියාකාරකම්වල අඛණ්ඩ පහත වැටීම පිළිබිඹු කරමින් ඉදිකිරීම් කටයුතු සඳහා වන ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකයේ සමස්ත ක්‍රියාකාරකම් දර්ශකය 44.3ක අගයක් වාර්තා කරන ලදී.** ව්‍යාපෘති කටයුතුවල අඛණ්ඩ පහත වැටීම ඉදිකිරීම් කටයුතුවල ක්‍රියාකාරිත්වයට අඛණ්ඩව අහිතකර ලෙස බලපෑ අතර මාසය පුරා පැවති වර්ෂාව දැනට පවතින ඉදිකිරීම් කටයුතුවල ප්‍රගතිය අඩාල කිරීමට ද හේතු විය.

නව ඇණවුම් සැප්තැම්බර් මාසයේදී අඛණ්ඩව පහත වැටුන ද පහත වැටීමේ වේගය පෙර මාසයට සාපේක්ෂව අඩු විය. විශේෂයෙන් විදේශ ආධාර ලබන සමහර ව්‍යාපෘති සඳහා ටෙන්ඩර් අවස්ථාවන් ක්‍රමයෙන් විවෘත වෙමින් පැවැතිය ද ලංසු මිල ඉතා තරඟකාරී බව සමීක්ෂණයට ප්‍රතිචාර දැක්වූවන් බොහොමයක් සඳහන් කරන ලදී. මේ අතර, බොහෝ සමාගම් අත්‍යවශ්‍ය කාර්ය මණ්ඩලය පමණක් පවත්වා ගැනීමට කැමැත්තක් දක්වන බැවින් සේවා නියුක්තිය පහත වැටුණි. තවද, ඉදිකිරීම් කටයුතුවල අඩුවීමට සමගාමීව, මාසය තුළ මිලදී ගැනීම් ප්‍රමාණය අඩු විය. මේ අතර, ප්‍රධාන වශයෙන් ඉල්ලුම අඩුවීම හේතුවෙන් ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය මෙමම මාසය තුළදී අඩු විය.

| විචල්‍යය | අගෝ. | අගෝ. | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **සමස්ත ක්‍රියාකාරකම්** | **47.0** | **44.3** | **-** | **වැඩි වේගයකින් පහළ යෑමක්** |
| නව ඇණවුම් | 41.2 | 45.7 | + | අඩු වේගයකින් පහළ යෑමක් |
| සේවා නියුක්තිය | 26.5 | 35.7 | + | අඩු වේගයකින් පහළ යෑමක් |
| තොග මිලදී ගැනුම් | 44.1 | 42.9 | - | වැඩි වේගයකින් පහළ යෑමක් |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | 47.0 | 48.6 | + | අඩු වේගයකින් පහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ප්‍රධාන වශයෙන්, ඉදිකිරීම් කටයුතුවලට අදාල ටෙන්ඩර් කටයුතු ක්‍රියාත්මක වෙමින් පැවතීම සහ රජය විසින් අත්හිටවූ ඇතැම් ව්‍යාපෘති නැවත ආරම්භ කිරීම පිළිබඳ පවතින යහපත් ප්‍රවනතා හේතුවෙන්, ඉදිරි මාස තුන සඳහා වූ අපේක්ෂාවන් ඉහළ ගොස් ඇත. කෙසේ වෙතත්, මෙහිදී බලශක්තිය ආශ්‍රිත වියදම් වැඩි වීමේ ප්‍රවණතාවය සහ අහිතකර කාලගුණික තත්ත්වයන් හේතුවෙන් ඉදිකිරීමේ කටයුතුවලට ඇතිවිය හැකි බලපෑම් පිලිබඳව අදාල සමාගම් අවධාරණය කර ඇත.

**සමස්ත ක්‍රියාකාරකම් දර්ශකය**
**2023 සැප්තැම්බර්**
**44.3**

### ඉදිකිරීම් අංශයේ සමස්ත ක්‍රියාකාරකම් දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

### ඉදිකිරීම් අංශයේ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය[1]

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගය පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

### විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්

සමස්ත ක්‍රියාකාරකම්: ඉදිකිරීම් ක්‍රියාකාරකම්වල සමස්ත පරිමාව. මෙය ජාත්‍යන්තර ක්‍රමවේදය අනුගමනය කරමින් "ඉදිකිරීම් අංශයේ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය" ලෙස හඳුන්වන මූලික දර්ශකය වන අතර එය කර්මාන්ත අංශයේ නිෂ්පාදන දර්ශකය සහ සේවා අංශයේ ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය හා සැසඳිය හැකි වේ.

සේවා නියුක්තිය: සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන.

තොග මිලදී ගැනුම්: නිෂ්පාදනය සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය මිලදී ගෙන ගබඩා කර තැබීම.

ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය: සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය.

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.

### සමීක්ෂණ ප්‍රතිචාර

මාසික ප්‍රතිචාර 35ක් පමණ ආවරණය වන පරිදි ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ලියාපදිංචිව ඇති ඉහළම ශ්‍රේණිගත දේශීය ඉදිකිරීම් සමාගම් ඉලක්ක කර ගනිමින් පසුගිය මාසයට සාපේක්ශව අදාල මාසයේ දී ඉදිකිරීම් කටයුතු වල ප්‍රවණතා ග්‍රහණය කරගැනීම සඳහා මෙම සමීක්ෂණය සිදු කරනු ලබයි.

[1] ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කර ඇත්තේ ගෝලීය ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක සම්පාදකයා ලෙස හඳුනාගෙන ඇති ලොව පුරා ආර්ථිකයන් 40කට අධික සංඛ්‍යාවක් සඳහා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක සම්පාදනය කරනු ලබන එස්&පී ග්ලෝබල් (S&P Global) අනුගමනය කරනු ලබන ක්‍රමවේදය භාවිතයෙනි.